දෙසතියක ඇරඹුම

2017.10.23 - 2017.11.07

අධ්‍යාපන අමාත්‍යාංශයේ එක් එක් ශාඛා මඟින් පැවැත්වීමට නියමිත උත්සව හා විශේෂ වැඩසටහන්

## කළමණාකරණ හා ප්‍රමිති ශාඛාව

**ඔක්තෝබර් 23**

**ගුරු ප්‍රතිභා ප්‍රභා - 2017**

ගුරුවරුන් හා විදුහල්පතිවරුන් ඇගයීමේ වැඩසටහන ගරු කථානායක තුමා හා ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (ලෝටස් ශාලාවේ) පැවැත්වේ.



## වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

**ඔක්තෝබර් 23**

පාසල් වල හොඳම වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන තරඟාවලියේ ත්‍යාග ප්‍රධානෝත්සවය අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරින් හා AAT ආයතනයේ නිලධාරිගේ සහභාගිත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වේ.

## නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව

**ඔක්තෝබර් 23, 24**

නොවිධිමත් අධ්‍යාපන ආදායම් ඉපයීමේ පාඨමාලා උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධන (නේවාසික) වැඩසටහන මෙනේරිපිටිය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

## මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව

**ඔක්තෝබර් 23, 24**

6 සිට 11 ශ්‍රේණි දක්වා ඉස්ලාම් විෂය ඉගෙනුම් ඉගැන්වීම් ආධාරක සැකසීමේ වැඩමුළුව නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේදී පැවැත්වේ.



## ගණිත ශාඛාව

**ඔක්තෝබර් 23, 25**

ක්‍රියාකාරකම් පාදක ගණිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රචලිත කිරීම සඳහා ගණිත සම්පත්දායකයින් බලගැන්වීමේ වැඩසටහන (උතුරු මැද පළාත) කලාවැව ධීවර පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**ඔක්තෝබර් 23 - 27**

අ.පො.ස (සා..පෙළ) - උපකාරක සම්මන්ත්‍රණ වැඩමුළුව - 2017 දී සාකච්ඡා කිරීම සඳහා ප්‍රශ්න පත්‍ර හා පිළිතුරු සඳහා මඟපෙන්වීම සකස් කිරීමේ වැඩසටහන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛා පුස්තකාලයේදී පැවැත්වේ. විශ්ව විද්‍යාල ආචාර්යවරුන් හා ජ්‍යෙෂ්ඨ ගුරුභවතුන් මේ සඳහා සහභාගි වේ.

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව

**ඔක්තෝබර් 23 - 27**

ජාතික මට්ටමේ පරිගණක දෘඩාංග හා ජාලකරණ නඩත්තු වැඩසටහන (මධ්‍යම පළාත) තෙල්දෙනිය කලාප කාර්යාලය, වලපනේ කලාප කාර්යාලය, නුවරඑළිය කලාප කාර්යාලය හා කොත්මලේ කලාප කාර්යාලයේදී පැවැත්වේ. මේ සඳහා ජාතික මට්ටමේ දෘඩාංග සංචිත සාමාජිකයින් සහභාගීවනු ඇත.



### නැණසල ඒකකය

**ඔක්තෝබර් 23 - 27**

දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපනය විෂය මාලාව ඉගෙනුම් කළමණාකරණ පද්ධතිය සකස් කිරීමේ වැඩසටහන නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේදී (CHBP) පැවැත්වේ.

### තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව

**ඔක්තෝබර් 24 - 27**

පාසල් මට්ටමේ අන්තර්ජාල ආරක්ෂණ සංසද පිහිටුවීමේ පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන කොළඹ 06 මිරාජ් හෝටලයේදී පැවැත්වේ. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය, යුනිසෙෆ් සංවිධානය හා ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය යන ආයතන වල නිලධාරීන් මේ සඳහා සහභාගී වනු ඇත

### පෞද්ගලික පාසල් ශාඛාව

**ඔක්තෝබර් 24 - 31**

පාසල් අධීක්ෂණ කටයුතු - පාසලේ පරිපාලන කටයුතු හා ආයතනික කටයුතු විධිමත් කිරීමේ වැඩසටහනක් කොළඹ 07 මියුසියස් විද්‍යාලයේදී, මාතර අනුර විද්‍යාලයේදී හා අකුරැස්ස බෝපාගොඩ අනුර විද්‍යාලයේදී පැවැත්වේ.

### නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව

**ඔක්තෝබර් 25, 26, 27**

ඊ තක්සලා වැඩසටහන 1 - 5 ශ්‍රේණි වල විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා ප්‍රතිනිර්මාණය කිරීමේ තෙදිනක වැඩසටහනක් නුගේගොඩ ධර්මවාහිනී ශබ්දාගාරයේදී පැවැත්වේ.

### ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**ඔක්තෝබර් 25, 26, 27**

අ.පො.ස (සා.පෙළ) - 2016 ඇගයීම් වාර්තා නව නිර්දේශයේ විෂයන් 11 ක් සඳහා සකස් කිරීමේ වැඩසටහන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛා පුස්තකාලයේදී තෝරාගත් ඇගයීම් මණ්ඩල ප්‍රධාන පරීක්ෂක ගුරුභවතුන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වේ



### තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව

**ඔක්තෝබර් 26**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා සීමිත තරග විභාගය මත බඳවාගත් නිලධාරීන් සඳහා පැවැත්වෙන දිශානිමුඛ කිරීමේ පාඨමාලාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන (සිංහල මාධ්‍ය බී කණ්ඩායම) මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේදී පැවැත්වේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාවේ නිලධාරීන් මේ සඳහා සහභාගිවනු ඇත

### තාක්ෂණ අධ්‍යාපන ශාඛාව

**ඔක්තෝබර් 26**

NIE ගෘහ විද්‍යාගාරය විවෘත කිරීම. පාසල් 100කට ලක්ෂ 5 බැගින් මුදල් ප්‍රධානය හා ගෘහ විද්‍යාගාර 150කට සිංගර් උපකරණ බෙදාදීමේ වැඩමුළුව ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ, ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමාගේ, ගරු අධ්‍යාපන ලේකම්තුමාගේ හා සිංගර් ආයතනයේ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේදී පැවැත්වේ.



### ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව

**ඔක්තෝබර් 26, 27**

බහුතල ඉගෙනුම් ක්‍රමවේදය පිළිබඳ පළාත් සම්පත්දායකයින් දැනුවත් කිරීමේ නේවාසික වැඩමුළුව ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේදී පැවැත්වේ.



### ගණිත ශාඛාව

**ඔක්තෝබර් 26, 27**

ක්‍රියාකාරකම් පාදක ගණිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රචලිත කිරීම සඳහා ගණිත සම්පත්දායකයින් බලගැන්වීමේ වැඩසටහන (නැගෙනහිර පළාත) මඩකලපුව සර්වෝදය මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

## වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

### ඔක්තෝබර් 29

අ.පො.ස (උ.පෙළ) ආර්ථික විද්‍යාව උගන්වනු ලබන ගුරුවරුන් සඳහා වන ඉරිදා දින 08ක සහතික පත්‍ර පාඨමාලාව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේදී පැවැත්වේ. මේ සඳහා වයඹ, බස්නාහිර හා සබරගමුව පළාත්වල ගුරුවරුන් සහභාගි වේ.

## තාක්ෂණ අධ්‍යාපන ශාඛාව

### ඔක්තෝබර් 30

සමස්ථ ලංකා ගෘහ ආර්ථික විද්‍යා විෂය දැනුම මිනුම තරඟාවලිය - 2017 අධ්‍යාපන ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේදී පැවැත්වේ.



## නැණස ඒකකය

### ඔක්තෝබර් 30 - 31

නැණස නාලිකාව 12 වන ශ්‍රේණිය සඳහා ගුරුවරු තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණය අධ්‍යාපන අමාත්‍යාංශයේදී පැවැත්වේ

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව

### ඔක්තෝබර් 31

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා සීමිත තරඟ විභාගය මත බඳවාගත් නිලධාරින් සඳහා පැවැත්වෙන දිශානිමුඛ කිරීමේ පාඨමාලාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන (සිංහල මාධ්‍ය සී කණ්ඩායම) මහරගම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේදී පැවැත්වේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාවේ නිලධාරින් මේ සඳහා සහභාගිවනු ඇත



## ඉංග්‍රීසි හා විදේශ භාෂා ශාඛාව

### නොවැම්බර් 01 - 02

අ.පො.ස (උ.පෙළ) ඉංග්‍රීසි විෂය හදාරන සිසුන් සඳහා ජාතික මට්ටමේ රූපවාහිණී ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන (LIT-Q) ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ, ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමාගේ, ගරු අධ්‍යාපන ලේකම්තුමා හා අතිරේක ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් රූපවාහිණී සංස්ථාවේදී පැවැත්වේ.

## සෞන්දර්ය ශාඛාව

### නොවැම්බර් 04, 05

සමස්ථ ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල - 2017, ජාතික වටය - 2 වන අදියර කුරුණෑගල මලියදේව බාලිකා විද්‍යාලයේදී පැවැත්වේ.

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව

### නොවැම්බර් 06 - 11

ඔරකල් (ORACLE) ආයතනය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අවබෝධතා ගිවිසුමක් අනුව " Java Fundamental " පරිගණක ක්‍රම ලේඛන පාඨමාලාව ගුරුභවතුන් 30 දෙනෙකුගේ සහභාගිත්වයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාවේ පරිගණක විද්‍යාගාරයේදී පැවැත්වේ.

## විෂය සමගාමී මාර්ගෝපදේශ - උපදේශන ශාඛාව

### නොවැම්බර් 06 - 07

තිරසර පාසල් වැඩසටහන යටතේ "දරුවන් සරකිමු" පාසල් මාර්ගෝපදේශ හා උපදේශන වැඩසටහන මීගොඩ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

සකැසුම - සංඛ්‍යාලේඛන අංශය